


# ජගත් ජේ එදිරිසිංහ ලියන

# ගිම්හාන සුළඟ 16

මම මහා දිග සිහිනයක් දකිමින් සිටියෙමි. ඒ සිහිනයේ සිටියේ අම්මාත් තාත්තාත් මාත් පමණකි. අපි හෝර්ටන් තැන්නේ මහා තෘණ තලාවේ ඇවිද යමින් සිටියෙමු. අම්මාත් තාත්තාත් මගේ දෙඅතින් අල්ලාගෙන සිටියේ මා ආරක්ෂා කර ගන්නට මෙන් ය. සීතල මීදුම් වළාවන් අප වෙළා ගනිද්දී මා උනුසුම් කරනු වස් ඔවුහු මා වැළඳ ගත්හ. අපි හාත්පස කිසිවක් නොපෙනෙන බියකරු අඳුරු වළාවකින් වැසී ගත් මහා බිම් තලාවක අතරමංව සිටියෙමු. ඒ අන්ධකාරය මැදින් ඇසෙන මහා බියකරු ගිගිරුම් හඬ මා මුසපත් කරවන සුලු විය. මා පිබිදුනේ ඒ හඬට යයි මට සිතෙයි.

තවමත් මගේ ඇඟ ගැහෙයි.

අම්මේ.. මම කෙඳිරුවෙමි.

මුහුණ මත සිසිලසක් දැනෙයි. මම අත ඔසවා මුහුණ පිසදා ගන්නට තැත් කළෙමි. කිසිවකු මගේ මුහුණට දිය ඉස ඇති බව මට වැටහෙයි.

කෞෂි..

මම ඇස් ඇර බැළුවෙමි. අමා මගේ මුහුණට එබී ගත්වන ම සිටියා ය. මම යළිදු දෑස් පියා ගත්තෙමි. ගත අප්‍රාණිකය. කිසිවකු මගේ මුහුණට පවන් සළනු මට දැනෙයි. ඒ කව්දැයි කියා ඇස් ඇර බලන්නට මට නොසිතෙයි. මා සිටින්නේ කෙනාතැනකද යන්න පවා එක වරම මට නොවැටහුණි.

අම්මා.. විදිළි සරයක් සේ මගේ සිත මත්තේ ඇගේ රුව ඇඳී ගියේ ය. මම නැගිටින්නට තැත් කලෙමි.

නංගි.. තව ටිකක් ඇළවෙලා ම ඉන්න.. ඒ කටහඬ සුනෙත් අයියා ගේ බව මම ඇදිනගතිමි.
බැහැ.. මට අම්ම බලන්න ඕනෙ.. මම මුරණ්ඩු වීමි.

සුනෙත් අයියා මගේ හිස මත අතක් තබා මදෙස බැළුවේ ය. යමක් කියන්නට ඔහුගේ දෙතොල වෙවුළනු මම දුටුවෙමි. කියන්නට ආ වදන් ගිලගනිමින් ඔහු නිහඬව බලා සිටයේ ය.

අපි යං කෞෂි... කතා කළේ අමා ය. .. දැන් ඉඳලා වැඩක් නැහැනෙ.. ඔක්කොම වැඩ කටයුතු ඉවරයි... මිනිස්සුත් ඔක්කොම ගිහින්..
යමු නංගි.. සුනෙත් අයියා මගේ අතින් අල්ලා ගත්තේ ය.
මම නැගිට්ටෙමි. ශාලාව හිස් ය. මූසල නිහඬතාව පමණක් ඉතිරිව තිබුණි.

බොඩි එක ක්‍රීමෙටෝරියම් එකට ගත්තා... අමා මිමිණුවා ය.

ශාලාවේ අම්මගේ දේහය තබා තිබූ ස්ථානය මට මතකය. එතැනට ඇවිද යන්නට මට සිතෙයි. කිසිවකු මා වැළැක්වූයේ නැත. මම අකීකරු දෙපා අදිමින් එතැනට පිය මැන්නෙමි. ඇගේ දේහය තබා තිබූ ස්ථානයේ නැවතුණෙමි. දණගසා හිස බිම ඔබා ගතිමි.

මං යනවා අම්මේ.... යි මිමිණුවෙමි. අම්මා කොතැනක හෝ සිට මට සවන් දෙනු ඇතැයි මම සිතුවෙමි. සුනෙත් අයියා පසුපසින් පැමිණ මගේ දෙඋරෙන් අල්ලා ඔසවන තෙක්ම එසේම සිටියෙමි.

අපි නිහඬවම සුසාන භූමිය හරහා ඇවිද එමින් සිටියෙමු. මේ යන්නේ කොහේදැයි අසන්නටවත් මට නිනව්වක් නොවී ය. රිය ගාල වෙත එන තෙක්ම කිසිවෙක් කතා කරන්නට නොවෙහෙසුණ හ.

නගින්න... සුනෙත් අයියා මා වෙනුවෙන් කාරයේ පිටුපස දොර ඇරියේ ය.

මම වාඩි වුණෙමි. අනෙක් පසින් ගොඩ වූ අමා මගේ හිස ඇගේ උරහිස මත රඳවා ගත්තා ය. එය මට මහා සුවයක් විය. සුනෙත් අයියා පිටුපස බලන කණ්නාඩියෙන් අප දෙස බලා වාහනය ඉදිරියට ගත්තේ ය.

නංගි මේ දවස් වල කොහෙද ඉන්නෙ..? බොහෝ වේලාවකට පසු ඔහු ඇසුවේ ය. මම හිතා මතාම පිළිතුරක් නොදී සිටියෙමි. මා අශේන් සමග සිටිනවා යයි කටක් ඇර කියන්නට බැරි කමක් මට දැනුණි.

මං දන්නවා ඔයා මේ දවස් වල අපේ ගෙදර නැති බව.. ඇයි ඔයා ගෙදරින් ගියේ..? ඔහු නැවත ඇසුවේ ය.

මේ ප්‍රශ්නයම මා වරෙක ඔහුගෙන් ඇසූ බව මට මතකය. එදා ඔහු ද මට පිළිතුරක් නොදුන්නේ ය.

ඔයා මොකක් හරි හේතුවක් නිසා ගෙදරින් ගියා... එදාම තමයි නැන්දා නිදි පෙති බිව්වෙ... එයා වැරදිලා නිදි පෙති වැඩියෙන් බිව්වා නෙවෙයි... මට තේරෙනවා මොකක් හරි දෙයක් වුණ බව.. සුනෙත් අයියා දිගටම කියයි.
සුනෙත්.. අමා මුනිවත බින්දා ය. .. අපි පස්සෙ වෙලාවක ඕවා කතා කරමු.. මේ ළමයට සැනසිල්ලෙ ඉන්න දෙන්න දැන්... මම කෘතවේදීත්වය පළ කරනු වස් ඇගේ අත අල්ලා ගත්තෙමි.

අප ඔවුනගේ කුඩා නිවසට එන තෙක්ම නිහඬතාව බිඳින්නට කිසිවකු වෙහෙසුණේ නැත.

කෞෂි අද මෙහේ නවතින්න.. ඔයාට ඕනෙ නම් ඕනෙ තරම් කාලයක් මෙහේ ඉන්න.. අමා කේතලය ලිප තබන අතර කීවා ය. ... දැන් ඕනෙ නම් නැවතිලා හිටිය තැනට කෝල් එකක් දාලා කියන්න අද එන්න නැහැයි කියලා..

මම සාලයේ සැප පුටුවක ගුලි ගැසී බලා සිටියෙමි. කිසිවක් කරන්නට හැඟීමක් සිතට නොඑයි. අශේන් පිළිබඳව පළමු වතාවට සිහිවුණේ දැන් ය. අද මා නොඑන බව ඔහුට කිව යුතු ද? මම සිතුවෙමි.

මෙන්න.. අමා දුරකථනය මා වෙත පෑවා ය. මම යාන්ත්‍රිකව අශේන්ගේ අංකය එබුවෙමි. අනෙක් කෙළවර දුරකථනය නාද වනු මට ඇසුණි. දුරකථනය ගන්නට නිවසේ කිසිවකු නැති බව අඟවමින් එය බොහෝ වේලාවක් නාද විය. මම දෙවෙනුව අශේන්ගේ ජංගම දුරකථන අංකය එබුවෙමි. මට ඇසුණේ ඒ දුරකථනය නිවා දමා ඇති බව කියැවෙන පටිගත කළ හඬ පමණකි.

අශේන් නිවසේ නැත. ඔහු පිටතට යන්නට ඇත.

රත් පැහැ ගත් සන්ධ්‍යා අහස මට ජනේලය තුළින් පෙනෙයි. තනිවූ මුහුදු ලිහිණියෙක් ඒ රතු පසුබිම හරහා පියඹමින් සිටියි. ඉන්මනින් අඳුර ගලා එනු ඇත. අසරණ කමත් තනි කමත් මා හෙම්බත් කරනු ලැබ ඇත. මම සැප පුටුවේ වකුටු වී දෑස් පියා ගනිමි. තෙහෙට්ටුව විසින් මා ඉක්මනින් නින්දට කැඳවාගනු ලබන්නට ඇත. උදෑසන අවදිවන විටත් මා සිටියේ සැප පුටුවේ වකුටු වී ගත් වන ම ය. සීතල ඉවසා ගන්නට බැරි තරම් දැඩි ය. කිසිවකු විසින් මා උණුසුම් කරනු වස් පොරවන ලද ඩූනාව බිම වැටී ඇත.

මම තිර රෙද්ද මෑත් කර ජනේලයෙන් පිටත බැලුවෙමි. උදෑසන සුන්දර ය. ඊයේ දවසට වඩා අද දවස සුන්දර වනවා නම් කොය් තරම් අගේද? සිදුවූ සියල්ල සිහිනයක් මෙනැයි සිතා හිත හදා ගන්නට මම සිතුවෙමි. සිත හදා ගත යුතු ය. ජීවිතයට මුහුණ දිය යුතුය.

ඔයාට පුටුවෙම නින්ද ගිය නිසා අපි කරදර කළේ නැහැ.. අමා කාමරයෙන් පිටතට එන අතර කීවා ය. මම සිනාසුණෙමි.
අමා අප තිදෙනාටම තේ හැදුවා ය. ඉදිරියට කළ යුතු වැඩ පිළිබඳ අපි සාකච්ඡා කළෙමු.

30 පිටට

**මෙතෙක් කතාව**

උසස් අධ්‍යාපනයා ඔස්ට්‍රේලියාවට එන මට විශ්ව විiාලයයේදි ගුරුසිංහ ඇමතිවරයාගේ පුතා වන අශේන් හමුවෙයි. අන්තර්ජාලයේදී මට හමුවන විශ්වත් මගේ මාමාගේ පුතා වන සුනෙත් අයියාත් මගේ දිවියේදී මා හා සමාන්තරව යමින් සිටියි. අම්මා සිය දෙවන විවාහයේ සැමියා වන ජයසිරි අංකල් සමග ඔස්ට්‍රේලියාවට එන්නේ මේ අතරේදීය ජයසිරි අංකල් අශේන්ගේ ඥාතියෙකි. තාත්තා ගුරුසිංහ ඇමතිට එරෙහිව ඡන්දයට එයි. නැන්දා සහ ජයසිරි අංකල් අතර සම්බන්ධයක් ඇති වෙයි. සුනෙත් අයියා නිවසෙන් යන්නට ගියේ මේ කාරණය නිසා ය. විශ්ව තමා විවාහ වූ බව හදිසියේම දවසක කියයි. සුනෙත් අයියා අමන්දා නම් තරුණිය හා හිතුවක්කාර ලෙස විවාහ වෙයි. නැන්දාගේ අනියම් සම්බන්ධය පිළිබඳව මාමා ඇ සමග කලහ කරගෙන නිවසින් පිටව යයි. එදා මාමා අනතුරකට ලක්ව මිය යයි. ජයසිරි අංකල්ගේ බලපෑමෙන් මිදන්නට මම නිවසින් පිටවුණෙමි. එදා රැයේ අම්මා වැඩියෙන් නිදි පෙති පානය කිරී ම නිසා මියයයි

**අද එතැන් සිට**